# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
# பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
# OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල. | 204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல. | 204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.


මගේ අංකය / எனது இலக்கம் / My No. } CSWP/FIN-AP/03/FI/04 | ඔබේ අංකය / உமது இலக்கம் / Your No. } | දිනය / திகதி / Date } 2026.03. 23

## මූල්‍ය චක්‍රලේඛ 02/2026

ආණ්ඩුකාර ලේකම්(බ.ප.),

සභා ලේකම් (බ.ප.),

පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් (බ.ප.)

සියළුම අමාත්‍යාංශ ලේකම්වරු (බ.ප.),

ප්‍රාදේශිය ලේකම්වරුන් (බ.ප.),

සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් (බ.ප.),

සමූපකාර සේවක කොමිෂන් සභා ලේකම් (බ.ප.),

### ආපදාවෙන් බලපෑමට ලක්වූවන් සවිබල ගැන්වීමේ වැඩසටහන

ආපදාවෙන් බලපෑමට ලක්වූවන් සවිබල ගැන්වීමේ වැඩසටහන සම්බන්ධයෙන් මුදල්, ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කරන ලද පහත සඳහන් චක්‍රලේඛ පිටපත් මේ සමඟ අමුණා ඇත.

| චක්‍රලේඛ අංකය | චක්‍රලේඛ නිකුත් කළ දිනය | කාරණය |
|---|---|---|
| අයවැය චක්‍රලේඛ 08/2025 | 2025.12.05 | ආපදාවෙන් බලපෑමට ලක්වූවන් සවිබල ගැන්වීමේ වැඩසටහන |
| අයවැය චක්‍රලේඛ 08/2025(i) | 2025.12.20 | ආපදාවෙන් බලපෑමට ලක්වූවන් සවිබල ගැන්වීමේ වැඩසටහන |
| අයවැය චක්‍රලේඛ 08/2025(ii) | 2026.01.08 | ආපදාවෙන් විනාශ වූ යටිතල පහසුකම් නැවත ගොඩනැගීම සහ ජන ජීවිතය යථාවත් කිරීම සඳහා 2026 වර්ෂයට අමතර ප්‍රතිපාදන සලසා දීම |
| අයවැය චක්‍රලේඛ 08/2025(iii) | 2026.01.22 | ආපදාවෙන් බලපෑමට ලක්වූවන් සවිබල ගැන්වීමේ වැඩසටහන |

02. ආණ්ඩුකාර ලේකම්ගේ අංක : GOS/ADM/6/2/19-2026 හා 2026.03.16 දිනැති ලිපිය මඟින් ඉහත චක්‍රලේඛයන් පවතින ආකාරයෙන්ම 2026.02.26 දින සිට බස්නාහිර පළාතට අදාල කරගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇති බව දැනුම් දී ඇත. එහෙයින් එම චක්‍රලේඛයන්හි සඳහන් විවිධාන ප්‍රකාරව කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි.

කේ.ජී. ප්‍රදීප් පුෂ්ප කුමාර,
ප්‍රධාන ලේකම්,
පළාත් මුදල් අමාත්‍යාංශ ලේකම් හා
පළාත් භාණ්ඩාගාර ලේකම්
බස්නාහිර පළාත.

දුරකථන : 0112-093416
ෆැක්ස් : 0112-092636
විද්‍යුත් ලිපිනය : accpay@cs.wpc.gov.lk

පිටපත: 01.විගණකාධිපති
02.අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන)
03.තොරතුරු තාක්ෂණ නිලධාරී.

# මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
# நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு
# MINISTRY OF FINANCE, PLANNING AND ECONOMIC DEVELOPMENT

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01. இலங்கை.
The Secretariat, Colombo 01. Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011 - 2484500, 011 - 2484600, 011 - 2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 2449823
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: BD/NSLE/103/DMD/09/2025
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2025-12-05

**අයවැය චක්‍රලේඛ අංක 08/2025**

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්/ දිසාපතිවරුන් හා ප්‍රාදේශීය ලේකම්වරුන්

**ආපදාවෙන් බලපෑමට ලක්වූවන් සවිබල ගැන්වීමේ වැඩසටහන**

අයහපත් කාලගුණික තත්ත්වය නිසා පැන නැඟුණු හදිසි ආපදා තත්ත්වය හේතුවෙන් අංක 2464/30 දරන 2025-11-28 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ශ්‍රී ලංකාවේ මහජන හදිසි අවස්ථා තත්ත්වයක් ප්‍රකාශයට පත් කර ඇත. ඒ අනුව, හදිසි ආපදා තත්ත්වය හේතුවෙන් බලපෑමට ලක්ව බිඳ වැටී ඇති ජන ජීවිතය යථා තත්ත්වයට පත් කිරීම සඳහා කඩිනමින් සහන සැලසිය යුතු බවට රජය තීරණය කර තිබේ.

02. එම සවිබල ගැන්වීමේ වැඩසටහන පහත පරිදි වේ.

| අනු අංකය | සහනය | දීමනාව |
|---|---|---|
| 1 | හදිසි ආපදා තත්ත්වය පහව යාමත් සමඟ ආපදාවෙන් බලපෑමට ලක් වූ පවුල්වලට තම නිවාස නැවත පදිංචියට යෝග්‍ය පරිදි පිරිසිදු කර සුරක්ෂිතව පදිංචි වීම සඳහා නිවසේ අයිතිය නොසලකා එක් නිවාස ඒකකයකට එක්වරක් පමණක් ගෙවන දීමනාව. | එක් නිවාස ඒකකයකට රු. 25,000/- |
| 2 | ආපදාවෙන් බලපෑමට ලක් වූ නිවාසවල නැවත පදිංචියට අත්‍යාවශ්‍ය මුළුතැන්ගෙයි බඩු මුට්ටු ආදිය මිලදී ගැනීම සඳහා නිවසේ අයිතිය නොසලකා එක් නිවාස ඒකකයකට එක්වරක් පමණක් ගෙවන දීමනාව. | එක් නිවාස ඒකකයකට රු. 50,000/- |
| 3 | නායයෑම් හා ගංවතුර හේතුවෙන් තම පදිංචි නිවස අහිමි වූ හෝ නිවස පූර්ණ ලෙස හානි වීම හේතුවෙන් ජීවනෝපාය කටයුතුවල අඛණ්ඩව නිරතවිය නොහැකි පවුල් වෙත මාස 03 ක කාලයක් එනම් 2025 දෙසැම්බර් හා 2026 ජනවාරි හා පෙබරවාරි මාස සඳහා ගෙවනු ලබන මාසික දීමනාව. | සාමාජිකයන් ගණන 02 හෝ ඊට අඩු පවුල් සඳහා රු. 25,000/-ක්<br><br>සාමාජිකයන් ගණන 02ට වැඩි පවුල් සඳහා රු. 50,000/- ක් |
| 4 | නායයෑම් හා ගංවතුර හේතුවෙන් තම නිවස අහිමි වී පදිංචි වීමට නිවසක් නොමැති නිවාස හිමියන් සඳහා නව නිවසක් ඉදි කර ගන්නා තෙක් වෙනත් ස්ථානයක තාවකාලිකව පදිංචි වීමට ලබා දෙන මාසික ගෙවල් කුලී දීමනාව. | උපරිමය මාස 06ක් දක්වා මාසිකව රු. 25,000/- බැගින් |
| 5 | ආපදාවෙන් බලපෑමට ලක් වූ වී, ධාන්‍ය, බඩ ඉරිඟු සහ ක්ෂේත්‍ර භෝග වගාබිම්වල වගා හානි හෝ නැවත වගා කිරීම සඳහා එක්වරක් පමණක් ගෙවනු ලබන දීමනාව | හෙක්ටයාරයකට රු. 150,000/-ක් වන පරිදි |

| අනු අංකය | සහනය | දීමනාව |
|---|---|---|
| 6 | ආපදාවෙන් බලපෑමට ලක් වූ එළවළු වගාබිම්වල වගා හානි හෝ නැවත් වගා කිරීම සඳහා එක්වරක් පමණක් ගෙවනු ලබන දීමනාව. | හෙක්ටයාරයකට රු. 200,000/- ක් වන පරිදි |
| 7 | ආපදාවෙන් බලපෑමට ලක් වූ සත්ත්ව පාලන ගොවිපළවල් සඳහා එක්වරක් පමණක් ගෙවනු ලබන දීමනාව (ලියාපදිංචි ගොවිපළ හිමියන් වෙත පමණි). | එක් ගොවිපල හිමියෙකුට රු. 200,000/- |
| 8 | ආපදාවෙන් බලපෑමට ලක්ව ඇණහිට ඇති තනි, සුළු හා ක්ෂුද්‍ර ව්‍යාපාර නැවත ආරම්භ කිරීමට සුදුසු තත්ත්වයට පත් කිරීම සඳහා එක්වරක් පමණක් ගෙවනු ලබන දීමනාව. | ඒකකයකට රු. 200,000/- |
| 9 | ආපදාවෙන් හානි වූ ධීවර බෝට්ටු සඳහා හානි පූරණය කිරීම | ධීවර බෝට්ටුවක් සඳහා උපරිමය රු. 400,000/- ක් දක්වා |
| 10 | ආපදා බලපෑමට ලක්වූ පාසල් සිසුන්ට පොත්පත් සහ ඇඳුම් පැළඳුම් මිල දී ගැනීම සඳහා එක්වරක් පමණක් ලබා දෙන දීමනාව. | එක් පාසල් දරුවෙක්ට රු. 15,000/- ක් |
| 11 | ආපදා බලපෑම හේතුවෙන් හානි වී ඇති ව්‍යාපාරික ගොඩනැඟිලි සඳහා හානි පූරණය. | ඒකකයකට උපරිමය රු. 5,000,000/- දක්වා හානි පූරණය (හානි තක්සේරුව අනුව) |
| 12 | ආපදා බලපෑම හේතුවෙන් පූර්ණ වශයෙන් හානි සිදුවී ඇති, පදිංචි වීමට නොහැකි නිවාස සඳහා නව නිවසක් ඉදි කර ගැනීමට ලබා දෙනු ලබන දීමනාව. | නිවාස ඒකකයකට රු. 5,000,000/- ක් |
| 13 | ආපදා බලපෑම හේතුවෙන් පදිංචිව සිටි නිවස පූර්ණ වශයෙන් හානි වී ඇති විට, නව නිවසක් ඉදිකිරීම සඳහා රජයේ ඉඩමක් ලබා දීමට නොහැකි අවස්ථාවක දී සුදුසු ඉඩමක් මිල දී ගැනීමට ගෙවනු ලබන දීමනාව. | එක් නිවාස ඒකකයකට උපරිමය රු. 5,000,000/- ක් |
| 14 | ආපදා බලපෑම හේතුවෙන් අර්ධ වශයෙන් හානි වූ නිවාස පිළිසකර කර ගැනීම සඳහා ගෙවනු ලබන දීමනාව. | උපරිමය රු. 2,500,000/- ක් දක්වා (හානි තක්සේරුව අනුව) |
| 15 | ආපදා බලපෑම හේතුවෙන් සිදු වූ ජීවිත හානියකදී මිය ගිය පුද්ගලයාගේ ළඟම ඥාතියා වෙත හෝ පූර්ණ ආබාධිත තත්ත්වයකට පත් වීමකදී අදාළ පුද්ගලයා වෙත හිමිගත්වනු ලබන දීමනාව. | එක් පුද්ගලයෙක් වෙත රු. 1,000,000/- ක් |

03. අංක 2464/30 දරන 2025-11-28 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කර ඇති හදිසි ආපදා තත්ත්වයට පමණක් ඉහත සහන සීමා වේ.

04. ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කරන ලද අංක 01/2025 දරන 2025-01-21 දිනැති ආපදා සහන සේවා චක්‍රලේඛයේ වගු අංක 01 හි සඳහන් (ii) සිට (x) දක්වා මෙන්ම (xiii) හා (xiv) සහනාධාර වර්ග ගෙවීමට මෙම චක්‍රලේඛය බාධාවක් නොවේ. එසේවුවද, එකී චක්‍රලේඛයේම වගු අංක 01 හි (i) යටතේ සඳහන් අවමංගල්‍ය කටයුතු සඳහා වන රු.50,000/- ක අත්තිකාරම් මුදල තවදුරටත් ගෙවිය හැකි අතර, එය මෙම චක්‍රලේඛයේ ඉහත වගුවේ අනු අංක 15 යටතේ හිමිගත්වනු ලබන ජීවිත හානියක දී ගෙවනු ලබන මුදලින් නැවත අඩු නොකළ යුතුය.

05. 2025 නොවැම්බර් මස 21 වන දින සිට බල පැ විස්තීරණ ආපදා තත්ත්වය හේතුවෙන් හානියට පත් නිවෙස් පදිංචියට සුදුසු පරිදි යථාවත් කර ගැනීම වෙනුවෙන් රු. 25,000/- ක දීමනාවක් ලබා දීම යන මැයෙන් ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කරන ලද අංක NDRSC/02/04/10 හා 2025-12-02 දිනැති ලිපිය මගින් හිමිගත්වා ඇති රු. 25,000/- ක දීමනාව දැනටමත් ලබාගෙන ඇති නිවාස ඒකක වෙත මෙම චක්‍රලේඛයේ ඉහත වගුවේ අනු අංක 1 යටතේ සඳහන් දීමනාව නැවත නොගෙවිය යුතුය.

06. මෙම චක්‍රලේඛයේ ඉහත වගුවේ අනු අංක 1, 2, 3, 4, 10, 11, 12, 13, 14 සහ 15 යටතේ දක්වා ඇති සහන සඳහා ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ දී සහ හානි තක්සේරු කළ යුතු අවස්ථාවල දී ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කරන ලද අංක 01/2025 දරන 2025-01-21 දිනැති ආපදා සහන සේවා මාර්ගෝපදේශය භාවිතා කළ යුතු වේ.

07. මෙම චක්‍රලේඛයේ ඉහත වගුවේ අනු අංක 5 යටතේ දක්වා ඇති වගා හානි සඳහා සහන ලබන ප්‍රතිලාභීන්ට රජයේ අරමුදල් මගින් ලබාදෙන වෙනත් වගා හානි සඳහාවන ප්‍රතිලාභ නොගෙවිය යුතුය.

08. මෙම චක්‍රලේඛයේ ඉහත වගුවේ අනු අංක 13 යටතේ ඉඩමක් සඳහා දීමනාව හිමිගැන්වීමෙන් පසුව, මුල් ඉඩම රජයට විධිමත් පරිදි පවරා ගැනීමට කටයුතු කෙරේ.

09. මෙම සහනවලට අදාල ප්‍රතිලාභීන්ගේ විස්තර සහ ගෙවීම් පිළිබඳ විධිමත් දත්ත හා තොරතුරු පවත්වා ගැනීමට ක්‍රියාත්මක කරන ආයතන වගබලා ගත යුතුවේ.

10. මෙම සවිබල ගැන්වීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ දී ඇමුණුම 01 හි සඳහන් වැය දරන ආයතන වෙත අවශ්‍ය ප්‍රතිපාදන භාණ්ඩාගාරය විසින් සලසා දෙනු ලැබේ.

**ආචාර්ය හර්ෂණ සූරියප්පෙරුම**
භාණ්ඩාගාර ලේකම්

පිටපත් :

1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
4. විගණකාධිපති

# සවිබල ගැන්වීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපාදන සලසාදීම සහ ක්‍රියාත්මක කිරීම

| අනු අංකය | සහනය | දීමනාව | ප්‍රතිපාදන සලසා දෙන වැය ශීර්ෂය | ක්‍රියාත්මක කිරීම |
|---|---|---|---|---|
| 1 | හදිසි ආපදා තත්ත්වය පහවයාමත් සමඟ ආපදාවෙන් බලපෑමට ලක් වූ පවුල්වලට තම නිවාස නැවත පදිංචියට යෝග්‍ය පරිදි පිරිසිදු කර සුරක්ෂිතව පදිංචි වීම සඳහා නිවසේ අයිතිය නොසලකා එක් නිවාස ඒකකයකට එක්වරක් පමණක් ගෙවන දීමනාව. | එක් නිවාස ඒකකයකට රු. 25,000/- | 103 - ආරක්ෂක අමාත්‍යාංශය | ප්‍රාදේශීය ලේකම් කාර්යාල |
| 2 | ආපදාවෙන් බලපෑමට ලක් වූ නිවාසවල නැවත පදිංචියට අත්‍යාවශ්‍ය මුළුතැන්ගෙයි බඩු මුට්ටු ආදිය මිලදී ගැනීම සඳහා නිවසේ අයිතිය නොසලකා එක් නිවාස ඒකකයකට එක්වරක් පමණක් ගෙවන දීමනාව. | එක් නිවාස ඒකකයකට රු. 50,000/- | 103 - ආරක්ෂක අමාත්‍යාංශය | ප්‍රාදේශීය ලේකම් කාර්යාල |
| 3 | නායයෑම් හා ගංවතුර හේතුවෙන් තම පදිංචි නිවස අහිමි වූ හෝ නිවස පූර්ණ ලෙස හානි වීම හේතුවෙන් ජීවනෝපාය කටයුතුවල අඛණ්ඩව නිරතවිය නොහැකි පවුල් වෙත මාස 03 ක කාලයක් එනම් 2025 දෙසැම්බර් හා 2026 ජනවාරි හා පෙබරවාරි මාස සඳහා ගෙවනු ලබන මාසික දීමනාව. | සාමාජිකයන් ගණන 02 හෝ ඊට අඩු පවුල් සඳහා රු. 25,000/-ක්<br><br>සාමාජිකයන් ගණන 02ට වැඩි පවුල් සඳහා රු. 50,000/- ක් | 103 - ආරක්ෂක අමාත්‍යාංශය | ප්‍රාදේශීය ලේකම් කාර්යාල |
| 4 | නායයෑම් හා ගංවතුර හේතුවෙන් තම නිවස අහිමි වී පදිංචි වීමට නිවසක් නොමැති නිවාස හිමියන් සඳහා නව නිවසක් ඉදි කර ගන්නා තෙක් වෙනත් ස්ථානයක තාවකාලිකව පදිංචි වීමට ලබා දෙන මාසික ගෙවල් කුලී දීමනාව. | උපරිමය මාස 06ක් දක්වා මාසිකව රු. 25,000/- බැගින් | 103 - ආරක්ෂක අමාත්‍යාංශය | ප්‍රාදේශීය ලේකම් කාර්යාල |
| 5 | ආපදාවෙන් බලපෑමට ලක් වූ වී, ධාන්‍ය, බඩ ඉරිඟු සහ ක්ෂේත්‍ර භෝග වගාබිම්වල වගා හානි හෝ නැවත වගා කිරීම සඳහා එක්වරක් පමණක් ගෙවනු ලබන දීමනාව. | හෙක්ටයාරයකට රු. 150,000/- ක් වන පරිදි | 281- ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව<br><br>285 - කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව / කෘෂිකර්ම දෙපාර්තමේන්තුව |
| 6 | ආපදාවෙන් බලපෑමට ලක් වූ එළවළු වගාබිම්වල වගා හානි හෝ නැවත වගා කිරීම සඳහා එක්වරක් පමණක් ගෙවනු ලබන දීමනාව. | හෙක්ටයාරයකට රු. 200,000/- ක් වන පරිදි | 285 - කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව |
| 7 | ආපදාවෙන් බලපෑමට ලක් වූ සත්ත්ව පාලන ගොවිපළවල් සඳහා එක්වරක් පමණක් ගෙවනු ලබන දීමනාව (ලියාපදිංචි ගොවිපළ හිමියන් වෙත පමණි). | එක් ගොවිපල හිමියෙකුට රු. 200,000/- | 292 - සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපා. | සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපා. |

| අනු අංකය | සහනය | දීමනාව | ප්‍රතිපාදන සලසා දෙන වැය ශීර්ෂය | ක්‍රියාත්මක කිරීම |
|---|---|---|---|---|
| 8 | ආපදාවෙන් බලපෑමට ලක්ව ඇණහිට ඇති තනි, සුළු හා ක්ෂුද්‍ර ව්‍යාපාර නැවත ආරම්භ කිරීමට සුදුසු තත්ත්වයට පත් කිරීම සඳහා එක්වරක් පමණක් ගෙවනු ලබන දීමනාව. | ඒකකයකට රු. 200,000/- | කර්මාන්ත අමාත්‍යාංශයේ ලියාපදිංචි තනි, සුළු හා ක්ෂුද්‍ර ව්‍යාපාර සඳහා වැය ශීර්ෂ අංක 149 - කර්මාන්ත අමාත්‍යාංශය | ප්‍රාදේශීය ලේකම් |
| | | | අනෙකුත් ලියාපදිංචි තනි, සුළු හා ක්ෂුද්‍ර ව්‍යාපාර සඳහා වැය ශීර්ෂ අංක 103 - ආරක්ෂක අමාත්‍යාංශය | ප්‍රාදේශීය ලේකම් |
| 9 | ආපදාවෙන් හානි වූ ධීවර බෝට්ටු සඳහා හානි පූරණය කිරීම. | ධීවර බෝට්ටුවක් සඳහා උපරිමය රු. 400,000/- ක් දක්වා | 290 - ධීවර හා ජලජ සම්පත් දෙපා. | ධීවර හා ජලජ සම්පත් දෙපා. |
| 10 | ආපදා බලපෑමට ලක්වූ පාසල් සිසුන්ට පොත්පත් සහ ඇඳුම් පැළඳුම් මිල දී ගැනීම සඳහා එක්වරක් පමණක් ලබා දෙන දීමනාව. | එක් පාසල් දරුවෙක්ට රු. 15,000/- ක් | 103 - ආරක්ෂක අමාත්‍යාංශය | ප්‍රාදේශීය ලේකම් කාර්යාල |
| 11 | ආපදා බලපෑම හේතුවෙන් හානි වී ඇති ව්‍යාපාරික ගොඩනැඟිලි සඳහා හානි පූරණය. | ඒකකයකට උපරිමය රු. 5,000,000/- දක්වා හානි පූර්ණය (හානි තක්සේරුව අනුව) | 103 - ආරක්ෂක අමාත්‍යාංශය | ප්‍රාදේශීය ලේකම් කාර්යාල |
| 12 | ආපදා බලපෑම හේතුවෙන් පූර්ණ වශයෙන් හානි සිදුවී ඇති, පදිංචි වීමට නොහැකි නිවාස සඳහා නව නිවසක් ඉදි කර ගැනීමට ලබා දෙනු ලබන දීමනාව. | නිවාස ඒකකයකට රු. 5,000,000/- ක් | 103 - ආරක්ෂක අමාත්‍යාංශය | ප්‍රාදේශීය ලේකම් කාර්යාල |
| 13 | ආපදා බලපෑම හේතුවෙන් පදිංචිව සිටි නිවස පූර්ණ වශයෙන් හානි වී ඇති විට, නව නිවසක් ඉදිකිරීම සඳහා රජයේ ඉඩමක් ලබා දීමට නොහැකි අවස්ථාවක දී සුදුසු ඉඩමක් මිල දී ගැනීමට ගෙවනු ලබන දීමනාව. | එක් නිවාස ඒකකයකට උපරිමය රු. 5,000,000/- ක් | 103 - ආරක්ෂක අමාත්‍යාංශය | ප්‍රාදේශීය ලේකම් කාර්යාල |
| 14 | ආපදා බලපෑම හේතුවෙන් අර්ධ වශයෙන් හානි වූ නිවාස පිළිසකර කර ගැනීම සඳහා ගෙවනු ලබන දීමනාව. | උපරිමය රු. 2,500,000/- ක් දක්වා (හානි තක්සේරුව අනුව) | 103 - ආරක්ෂක අමාත්‍යාංශය | ප්‍රාදේශීය ලේකම් කාර්යාල |
| 15 | ආපදා බලපෑම හේතුවෙන් සිදු වූ ජීවිත හානියකදී මිය ගිය පුද්ගලයාගේ ළඟම ඥාතියා වෙත හෝ පූර්ණ ආබාධිත තත්ත්වයකට පත් වීමකදී අදාළ පුද්ගලයා වෙත හිමිගත්වනු ලබන දීමනාව. | එක් පුද්ගලයෙක් වෙත රු. 1,000,000/- ක් | 103 - ආරක්ෂක අමාත්‍යාංශය | ප්‍රාදේශීය ලේකම් කාර්යාල |

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு
MINISTRY OF FINANCE, PLANNING AND ECONOMIC DEVELOPMENT

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01. இலங்கை.
The Secretariat, Colombo 01. Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011 - 2484500, 011 - 2484600, 011 - 2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 2449823
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல. / My No.: BD/NSLE/103/DMD/09/2025
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2025-12-20

**අයවැය චක්‍රලේඛ අංක 08/2025(i)**

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්/ දිසාපතිවරුන් හා ප්‍රාදේශීය ලේකම්වරුන්

**ආපදාවෙන් බලපෑමට ලක්වූවන් සවිබල ගැන්වීමේ වැඩසටහන**

අයහපත් කාලගුණික තත්ත්වය නිසා පැන නැගුණු හදිසි ආපදා තත්ත්වය හේතුවෙන් බලපෑමට ලක්ව බිඳ වැටී ඇති ජන ජීවිතය යථා තත්ත්වයට පත් කිරීම සඳහා, 2025-12-05 දිනැති අයවැය චක්‍රලේඛ අංක 08/2025 මඟින් යෝජිත සවිබල ගැන්වීමේ වැඩසටහන වඩාත් කාර්යක්ෂමව හා ඵලදායීව ක්‍රියාත්මක කිරීමට නව එකතු කිරීම් පැහැදිලි කිරීම් හා සංශෝධන ඇතුළත් කිරීමට මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

02. ඒ අනුව, අයවැය චක්‍රලේඛ අංක 08/2025 හි සඳහන් වගුවේ අනු අංක 3, 5, 6, 7, 9, 11, 12 සහ 14 පහත පරිදි සංශෝධනය කෙරේ.

| 08/2025 චක්‍රලේඛයේ වගුවේ අනු අංකය | යෝජිත සහනය | දීමනාව |
|---|---|---|
| 3 | නායයෑම් හා ගංවතුර හේතුවෙන් තම පදිංචි නිවස අහිමි වූ හෝ නිවස පූර්ණ ලෙස හානි වීම හේතුවෙන් තම ස්ථිර ජීවනෝපාය කටයුතුවල අඛණ්ඩව නිරත වීමට නොහැකි පවුල් වෙත **උපරිමය මාස 03 ක** කාලයක් සඳහා ගෙවනු ලබන මාසික දීමනාව. | සාමාජිකයන් ගණන 02 හෝ ඊට අඩු පවුලක් සඳහා රු. 25,000/- ක දීමනාව<br>සාමාජිකයන් ගණන 02ට වැඩි පවුලක් සඳහා රු. 50,000/- ක දීමනාව |
| 5 | ආපදාවෙන් බලපෑමට ලක් වූ **වී, ධාන්‍ය, බඩ ඉරිඟු, රටකජු සහ ක්ෂේත්‍ර භෝග** වගාබිම්වල වගා හානි හෝ නැවත වගා කිරීම සඳහා එකවරක් පමණක් ගෙවනු ලබන දීමනාව | හෙක්ටයාර එකකට රු. 150,000/- |
| 6 | ආපදාවෙන් බලපෑමට ලක් වූ **එළවළු, මිරිස්, ළූණු යන භෝග සහ කෙසෙල්, පැපොල් හා අන්නාසි යන පලතුරු** වගාබිම්වල වගා හානි හෝ නැවත වගා කිරීම සඳහා එක්වරක් පමණක් ගෙවනු ලබන දීමනාව. | හෙක්ටයාරයකට රු. 200,000/- |

| 08/2025 චක්‍රලේඛයේ වගුවේ අනු අංකය | යෝජිත සහනය | දීමනාව |
|---|---|---|
| 7 | ආපදාවෙන් බලපෑමට ලක් වූ සත්ත්ව පාලන ගොවිපළවල්වල මියගිය සතුන් ගණන පදනම් කරගෙන ගෙවනු ලබන දීමනාව (ලියාපදිංචි ගොවිපල හිමියන් වෙත පමණි). | |
| | 7.1 (අ) ගව පාලනය - දෙමුහුම් | මියගිය එක් සතෙකු සඳහා රු. 200,000/- බැගින් උපරිමය සතුන් 10 ක් දක්වා (උපරිම ගෙවීම රු. 2,000,000/-) |
| | 7.1 (ආ) ගව පාලනය - දේශීය | මියගිය එක් සතෙකු සඳහා රු. 50,000/- බැගින් උපරිමය සතුන් 20 ක් දක්වා (උපරිම ගෙවීම රු. 1,000,000/-) |
| | *7.1 (අ) සහ 7.1 (ආ) යටතේ සඳහන් සතුන් කාණ්ඩ දෙකම සිටින ගොවිපලක් සඳහා උපරිම ගෙවීම රු. 2,000,000/- කි.* | |
| | 7.2 ශූකර පාලනය | මියගිය එක් සතෙකු සඳහා රු. 20,000/- බැගින් උපරිමය සතුන් 20 ක් දක්වා (උපරිම ගෙවීම රු. 400,000/-) |
| | 7.3 එළු/ බැටළු පාලනය | මියගිය එක් සතෙකු සඳහා රු. 20,000/- බැගින් උපරිමය සතුන් 20 ක් දක්වා (උපරිම ගෙවීම රු. 400,000/-) |
| | 7.4 (අ) කුකුළු පාලනය - ලේයර් | මියගිය එක් සතෙකු සඳහා රු. 500/- බැගින් උපරිම ගෙවීම රු. 1,000,000/- දක්වා |
| | 7.4 (ආ) කුකුළු පාලනය - බ්‍රොයිලර් | මියගිය එක් සතෙකු සඳහා රු. 250/- බැගින් උපරිම ගෙවීම රු. 1,000,000/- දක්වා |
| | *7.4 (අ), 7.4 (ආ) යටතේ සඳහන් සතුන් කාණ්ඩ දෙකම සිටින ගොවිපලක් සඳහා උපරිම ගෙවීම රු. 1,000,000/- කි.* | |
| | 7.5 ගෙවතු ආශ්‍රිත කුකුළු පාලනය | ඒකකයකට රු. 10,000/- ක එක්වරක් පමණක් ගෙවන දීමනාව |
| 9 | ආපදාවෙන් හානි වූ ධීවර කර්මාන්තය යළි නගා සිටුවීම | |
| | 9.1 ආපදාවෙන් හානි වූ කරදිය ධීවර කර්මාන්තයේ යොදවා ඇති බෝට්ටු සහ දැල් සඳහා සහන ලබා දීම | |
| | පූර්ණ ලෙස හානි වූ ධීවර බෝට්ටු | හානි වූ ධීවර බෝට්ටුව සඳහා ලැබෙන රක්ෂණ වන්දි මුදල සී/ස සීනෝර් පදනම වෙත ගෙවීමට යටත්ව නව බෝට්ටුවක් එම පදනම මඟින් ලබා දීම |
| | අර්ධ ලෙස හානි වූ ධීවර බෝට්ටු | සී/ස සීනෝර් පදනම මඟින් අලුත්වැඩියා කර දීම |

| 08/2025 චක්‍රලේඛයේ වගුවේ අනු අංකය | | යෝජිත සහනය | දීමනාව |
|---|---|---|---|
| | | ආපදාවෙන් දැල් අහිමි වූ ධීවරයන්ට නෝර්ත් සී ලිමිටඩ් මඟින් දැල් මිලදී ගැනීමට එක්වරක් පමණක් ගෙවනු ලබන දීමනාව. | එක් ධීවරයෙක්ට රු. 100,000/- ක් වටිනා කූපන් පතක් |
| | 9.2 | ආපදාවෙන් හානි වූ වැව් ආශ්‍රිත මිරිදිය ධීවර කර්මාන්තයේ යොදවා ඇති කුඩා ඔරු හා දැල් සඳහා වන දීමනාව | |
| | | පූර්ණ ලෙස හානි වූ ඔරු | එක් ධීවරයෙක් සඳහා රු.100,000/-ක එක්වරක් පමණක් ගෙවන දීමනාව |
| | | අර්ධ ලෙස හානි වූ ඔරු | සී/ස සීනෝර් පදනම මඟින් අලුත්වැඩියා කර දීම |
| | | හානි වූ දැල් | හානි වූ එක් දැලක් සඳහා රු. 15,000/- ක් බැගින් එක් ධීවරයෙක්ට උපරිම දැල් 5ක් සඳහා ගෙවන දීමනාව (උපරිම රු. 75,000/- කි) |
| 11 | | ආපදා බලපෑම හේතුවෙන් හානි වී ඇති ස්ථිර ව්‍යාපාරික ගොඩනැගිලි සඳහා ව්‍යාපාර ගොඩනැගිලි හිමියෙකුට නැවත තම ව්‍යාපාරික ස්ථානය යථාවත් කර ගැනීම සඳහා දෙනු ලබන දීමනාව. | |
| | 11.1 | හානි තක්සේරුවකින් තොරව වන්දි ලබා ගැනීමට කැමැත්ත ප්‍රකාශකරන ව්‍යාපාරික ගොඩනැගිලි හිමියෙකුට ගෙවනු ලබන දිමනාව | එක් ව්‍යාපාර හිමියෙකුට රු. 500,000/- කි. |
| | 11.2 | හානි තක්සේරුවකින් පසුව වන්දි ලබා ගැනීමට කැමැත්ත ප්‍රකාශකරන ව්‍යාපාරික ගොඩනැගිලි හිමියෙකුට ගෙවනු ලබන දිමනාව | එක් ව්‍යාපාර හිමියෙකුට තක්සේරුගත වටිනාකම මත ගෙවනු ලබන උපරිම දීමනාව රු. 5,000,000/-කි |
| 12. | | ආපදා බලපෑම හේතුවෙන් **පූර්ණ වශයෙන් හානි සිදුවී ඇති, නායයෑමේ අවදානම් තත්ත්වය හේතුවෙන් පදිංචි වීමට නොහැකි බවට ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය මඟින් තහවුරු කර ඇති නිවාස** සඳහා නව නිවසක් ඉදි කර ගැනීමට ලබා දෙනු ලබන දීමනාව. | පදිංචි නිවස සඳහා නිවාස හිමියෙකුට රු. 5,000,000/- ක් බැගින් |
| 14 | | ආපදා බලපෑම හේතුවෙන් අර්ධ වශයෙන් හානි වූ නිවාස පිළිසකර කර ගැනීම සඳහා නිවාස හිමියෙකුට උපරිමය රු. 2,500,000/- ක් දක්වා ගෙවනු ලබන දීමනාව. | |
| | 14.1 | හානි තක්සේරුවකින් තොරව වන්දි ලබා ගැනීමට කැමැත්ත ප්‍රකාශකරන නිවාස හිමියෙකුට ගෙවනු ලබන දිමනාව | එක් නිවාස හිමියෙකුට රු. 500,000/- කි |
| | 14.2 | හානි තක්සේරුවකින් පසුව වන්දි ලබා ගැනීමට කැමැත්ත ප්‍රකාශකරන නිවාස හිමියෙකුට ගෙවනු ලබන දිමනාව | එක් නිවාස හිමියෙකුට තක්සේරුගත වටිනාකම මත ගෙවනු ලබන උපරිම වන්දිය රු. 2,500,000/-කි |

03. ආපදා තත්ත්වය හේතුවෙන් හානියට පත් ආගමික ස්ථාන පිරිසිදු කර යථා තත්ත්වයට පත්කර ගැනීමට ලබාදෙන රු. 25,000/- ක එක් වරක් පමණක් ගෙවනු ලබන දීමනාව ආගමික කටයුතු සම්බන්ධ විෂය භාර දෙපාර්තමේන්තු විසින් ලබාදෙන නිර්දේශ අනුව බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරනු ලැබේ.

04. මෙම සව්බල ගැන්වීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී අදාල රේඛීය අමාත්‍යාංශය සහ දෙපාර්තමේන්තු විසින් සුදුසු පරිදි අවශ්‍ය උපදෙස් නිකුත් කරනු ඇත.

05. අයවැය චක්‍රලේඛ අංක 08/2025 හි සඳහන් අනෙකුත් කරුණු නොවෙනස්ව පවතී.

ඒ. එන්. හපුගල
භාණ්ඩාගාර ලේකම් (වැ.බ.)

පිටපත් :

1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
4. විගණකාධිපති

# මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
# நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு
# MINISTRY OF FINANCE, PLANNING AND ECONOMIC DEVELOPMENT

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව. | செயலகம், கொழும்பு 01. இலங்கை. | The Secretariat, Colombo 01. Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011 - 2484500, 011 - 2484600, 011 - 2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 2449823
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: BD/NSLE/103/DMD/09/2025
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2026-01-08

**අයවැය චක්‍රලේඛ අංක 08/2025(ii)**

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් සහ පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්

**ආපදාවෙන් විනාශ වූ යටිතල පහසුකම් නැවත ගොඩනැගීම සහ ජන ජීවිතය යථාවත් කිරීම සඳහා 2026 වර්ෂයට අමතර ප්‍රතිපාදන සලසාදීම**

අයහපත් කාලගුණික තත්ත්වය නිසා පැන නැගුණු හදිසි ආපදා තත්ත්වය හේතුවෙන් ව්‍යසනයට පත් ප්‍රදේශ නැවත නගා සිටුවමින් අඩපනව ඇති දෛනික ජන ජීවිතය යථා තත්ත්වයට පත් කිරීම, බලපෑමට ලක්වූවන් සවිබල ගැන්වීම හා හානි වූ යටිතල පහසුකම් කඩිනමින් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වියදම් දැරීමට අවශ්‍ය ප්‍රතිපාදන සලසා දෙමින් රු. බිලියන 500ක පරිපූරක ඇස්තමේන්තුවක් 2025.12.19 වන දින පාර්ලිමේන්තුව විසින් අනුමත කර තිබේ.

02. 2026 වර්ෂයේ වියදම් දැරීම සඳහා අනුමත කරන ලද 2025 අංක 23 දරන විසර්ජන පනතෙහි ඇතුළත්ව ඇති ප්‍රතිපාදනවලට අමතරව ආපදාවෙන් හානි වූ යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය කිරීම සහ ජන ජීවිතය යථාවත් කිරීම සඳහා මෙම ප්‍රතිපාදන ලබා දෙනු ඇත.

03. "ශ්‍රී ලංකාව නැවත ගොඩනැගීම, ආපදා තත්ත්වයට ප්‍රතිචාර වශයෙන් රාජ්‍ය ආයෝජන ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීම සඳහා මාර්ගෝපදේශය" යන ශීර්ෂයෙන් භාණ්ඩාගාර ලේකම් විසින් නිකුත් කළ අංක NP/ENM/DIM/PDNA/2025 දරන 2025.12.30 දිනැති මාර්ගෝපදේශය අනුව කටයුතු කර ඔබ ආයතනයේ විෂය පථයට ගැනෙන හානි වූ යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණ සහ නැවත ඉදිකිරීම සඳහා වන රාජ්‍ය ආයෝජන ව්‍යාපෘති වෙනුවෙන් 2026 වර්ෂයට අවශ්‍ය අමතර ප්‍රතිපාදන, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ නිර්දේශ ලබා ගැනීමෙන් පසුව මෙම චක්‍රලේඛයේ ඇමුණුම 01 ආකෘතිය මඟින් ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙතින් ඉල්ලුම් කළ යුතුය.

04. ඉහත මාර්ගෝපදේශය මඟින් ආවරණය නොවන, ආපදා තත්ත්වය හේතුවෙන් බලපෑමට ලක්වූ ජන ජීවිතය යථා තත්ත්වයට පත් කිරීම සඳහා වූ සියළුම දීමනා සහ වන්දි ගෙවීම් වෙනුවෙන් 2026 වර්ෂයට අවශ්‍ය ප්‍රතිපාදන, අදාළ දීමනාව/වන්දිය ගෙවීමට ප්‍රතිපාදන සලසා ගත යුතු අමාත්‍යාංශය / ආයතනය විසින් මෙම චක්‍රලේඛයේ ඇමුණුම 02 ආකෘතිය මඟින් ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙතින් කඩිනමින් ඉල්ලුම් කළ යුතුය.

05. ඉහත ඇමුණුම් 01 සහ 02 පහත QR කේතය මඟින් ද බාගත කළ හැකිය.

**ආචාර්ය හර්ෂණ සූරියප්පෙරුම**
**භාණ්ඩාගාර ලේකම්**

පිටපත්:
1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
4. සභාපති, මුදල් කොමිෂන් සභාව
5. විගණකාධිපති

ඇමුණුම I

## ආපදාවෙන් හානියට පත් යටිතල පහසුකම් පුනරුත්ථාපනය / නැවත ඉදිකිරීම (රාජ්‍ය ආයෝජන ස්වභාවයේ)

| අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව/ ආයතනය | ව්‍යාපෘතිය/ වැඩසටහන/ කොන්ත්‍රාත් පැකේජයේ නම | ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව නිර්දේශ කළ දිනය | ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව නිර්දේශ කළ මුළු ඇස්තමේන්තුගත පිරිවැය (රු.මිලියන) | 2026 වර්ෂයේ මුළු ප්‍රතිපාදන අවශ්‍යතාවය (රු.මිලියන) | 2026 වර්ෂයට අවශ්‍ය මුළු ප්‍රතිපාදන ප්‍රමාණයෙන්, 2026 අයවැය ඇස්තමේන්තු තුළ සලසා ඇති ප්‍රතිපාදනවලින් කළමනාකරණය කර ගත හැකි ප්‍රතිපාදන ප්‍රමාණය (රු.මිලියන) | 2026 වර්ෂය සඳහා අවශ්‍ය අතිරේක ප්‍රතිපාදනය (රු.මිලියන) | ව්‍යාපෘතිය ආරම්භ කිරීමට අපේක්ෂිත මාසය | ව්‍යාපෘතිය අවසන් කිරීමට අපේක්ෂිත වර්ෂය සහ මාසය |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |

අමාත්‍යාංශ ලේකම්වරයාගේ / පළාත් සභා ප්‍රධාන ලේකම්වරයාගේ නිර්දේශය ;

ඇමුණුම II

## ආපදාවෙන් බලපෑමට ලක් වූවන් සඳහා දීමනා සහ වන්දි ගෙවීමට ප්‍රතිපාදන අවශ්‍යතාවය

| ප්‍රතිපාදන ලබා දිය යුතු අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව / ආයතනය[1] | දීමනාවේ නම[2] | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 2026 වර්ෂය සඳහා අවශ්‍ය ප්‍රතිපාදන (රු.මිලියන) |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

අමාත්‍යාංශ ලේකම්වරයාගේ / පළාත් සභා ප්‍රධාන ලේකම්වරයාගේ නිර්දේශය :

1. අයවැය චක්‍රලේඛ අංක 08/2025 ඇමුණුම I හි සඳහන් ප්‍රතිපාදන සලසා දෙන වැය ශීර්ෂය අනුව ඉල්ලුම් කළ යුතුය

2. අයවැය චක්‍රලේඛ අංක 08/2025 , 08/2025(i) සහ ආපදාවෙන් බලපෑමට ලක්වූවන් සඳහා වන්දි / දීමනා ගෙවීමට අදාළ අමාත්‍ය මණ්ඩල තීරණ අනුව තිම් ගන්වනු ලබන දීමනා

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு
MINISTRY OF FINANCE, PLANNING AND ECONOMIC DEVELOPMENT

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01. இலங்கை.
The Secretariat, Colombo 01. Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011 - 2484500, 011 - 2484600, 011 - 2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 2449823
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல. / My No.: BD/NSLE/103/DMD/09/2025
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2026-01-22

**අයවැය චක්‍රලේඛ අංක 08/2025(iii)**

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්/ දිසාපතිවරුන් හා ප්‍රාදේශීය ලේකම්වරුන්

**ආපදාවෙන් බලපෑමට ලක්වූවන් සවිබල ගැන්වීමේ වැඩසටහන**

අයහපත් කාලගුණික තත්ත්වය නිසා පැන නැගුණු හදිසි ආපදා තත්ත්වය හේතුවෙන් බලපෑමට ලක්ව බිඳ වැටී ඇති ජන ජීවිතය යථා තත්ත්වයට පත් කිරීම සඳහා, 2025-12-05 දිනැති අයවැය චක්‍රලේඛ අංක 08/2025 සහ ඊට අදාලව නිකුත් කරන ලද සංශෝධිත චක්‍රලේඛ මඟින් යෝජිත සවිබල ගැන්වීමේ වැඩසටහන තුළින් ආපදාවෙන් බලපෑමට ලක්වූ ජනතාවගේ ජීවන තත්ත්වය වඩා ඵලදායී අයුරින් වැඩිදියුණු කිරීම සඳහා, ආපදාවෙන් බලපෑමට ලක්ව ඇණහිට ඇති ව්‍යාපාර වෙත තවදුරටත් පුළුල්ව සහන සැලසීමේ අරමුණින් මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

02. ඒ අනුව, අංක 08/2025 අයවැය චක්‍රලේඛයෙහි වගුවේ අනු අංක 8 හි සඳහන් දීමනා ලබාදීම වඩාත් කාර්යක්ෂමව හා ඵලදායීව ක්‍රියාත්මක කිරීමට පහත පරිදි පැහැදිලි කිරීම් හා සංශෝධන ඇතුළත් කරනු ලැබේ.

| අනු අංකය | | සහනය | දීමනාව |
|---|---|---|---|
| 8 | | ආපදාවෙන් බලපෑමට ලක්ව ඇණහිට ඇති ව්‍යාපාර නැවත ආරම්භ කිරීමට සුදුසු තත්ත්වයට පත් කිරීම සඳහා එක්වරක් පමණක් ගෙවනු ලබන දීමනාව | |
| | 8.1 | කර්මාන්ත අමාත්‍යාංශයේ ලියාපදිංචි තනි, සුළු හා ක්ෂුද්‍ර ව්‍යාපාර සඳහා | ඒකකයකට රු. 200,000/- |
| | 8.2 | ව්‍යාපාරයක් ලෙස ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ලියාපදිංචි තනි, සුළු හා ක්ෂුද්‍ර ව්‍යාපාර සඳහා | ඒකකයකට රු. 200,000/- |
| | 8.3 | ලියාපදිංචි නොවූ ගෘහස්ථව ස්ථිර ගොඩනැගිල්ලක පවත්වාගෙන යන වෙළඳ ව්‍යාපාර සඳහා | ඒකකයකට රු. 50,000/- |
| | 8.4 | ලියාපදිංචි නොවූ නිෂ්පාදන කර්මාන්ත හා හරිතාගාර යනාදිය සඳහා | ඒකකයකට රු. 50,000/- |
| | 8.5 | පදික සහ ජංගම ඇතුළු තාවකාලිකව සිදු කරන වෙළඳාම් සඳහා | ඒකකයකට රු. 25,000/- |

03. මෙහිදී, 8.1 හා 8.2 කාණ්ඩ යටතේ දක්වා ඇති **එක් ව්‍යාපාර ඒකකයක් සඳහා** ලබා ගත හැක්කේ එක් දීමනාවක් පමණි.

04. යම් **ප්‍රතිලාභියෙක්** ඉහත 8.3, 8.4 සහ 8.5 කාණ්ඩ යටතේ වන දීමනාවලින් කිහිපයක් සඳහා සුදුසුකම් ලබයි නම්, එහිදී හිමිගැන්විය යුත්තේ එම කාණ්ඩවලින් එක් කාණ්ඩයක් යටතේ වන දීමනාවක් පමණි. අවශ්‍ය ප්‍රතිපාදන වැය ශීර්ෂ අංක 103 යටතේ ආරක්ෂක අමාත්‍යාංශය වෙත සලසා දෙනු ලබන අතර ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා ගෙවීම් සිදු කරනු ලැබේ.

05. අයවැය චක්‍රලේඛ අංක 08/2025 සහ 08/2025 (i) හි සඳහන් අනෙකුත් කරුණු නොවෙනස්ව පවතී.

**ආචාර්ය හර්ෂණ සූරියප්පෙරුම**
භාණ්ඩාගාර ලේකම්

පිටපත් :

1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
4. ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය
5. ලේකම්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
6. විගණකාධිපති